**ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව - 2024**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල, පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.11,044,341ක් හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණවල වර්ෂයට අදාළව එකතු වූ වටිනාකම රු.12,010,954 ක් වීම හේතුවෙන් රු. 966,613 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු ලෙස 201-1-1-0-2102 හා 2103 යටතේ මිලදී ගත් මූලධන වත්කම් වලට අමතරව ශාසනාරක්ෂක බල මණ්ඩලය සඳහා පහසුකම් සැලසීමට අදාළ වැය විෂය වන 201-2-2-9-2205 යටතේද මූලධන වත්කම් මිලදී ගෙන තිබීමත් එම මිලදී ගැනීම් අදාළ වවුචර්පත් සිගාස් හි ඇතුළත් කිරීමේ දී එම වැඩසටහනෙහි පවතින තාක්ෂණික තත්වය යටතේ මූලධන වත්කම් මිලදී ගැනීම් වශයෙන් ඇතුළත් කිරීමට ඉඩ ලබා නොදීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් යටතට ඇතුළත් නොවීමත් එහෙත් වත්කම් මිලදී ගැනීමක් සිදු වී ඇති නිසා එම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වර්ෂයට අදාළ එකතු වූ වටිනාකම යටතේ පෙන්විම නිසා බවත් 2024 වර්ෂයේ දී අපහරණය කරන ලද වත්කම් වල වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ අඩුකර පෙන්විම බවත් දන්වා තිබුණි. | මූල්‍ය වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෙනත් ආයතන විසින් සිදු කර තිබූ මිලදී ගැනීම්වල එකතුව වූ රු.261,121ක් ඒසීඒ 6 ආකෘතියෙහි වර්ෂයේ මිලදී ගැනීම් වශයෙන් | වෙනත් ආයතන වෙත දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන වෙන් කර දීම තුළින් එම ආයතන විසින් වත්කම් මිලදී ගැනීමේ දී එම ගෙවීම් මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වශයෙන් ඇතුළත් කිරීමට සිගාස් වැඩසටහන තුළ නොහැකි බවත් දෙපාර්තමේන්තුව මඟින් මිලදී ගෙන නොතිබීම නිසා ගෙවීම් වවුචර් ඇතුළත් කිරීමක් සිදු කළ නොහැකි වන බැවින් එම අවස්ථාව | මූල්‍ය වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

| | |
|---|---|
| සඳහන් කිරීම වෙනුවට ආරම්භක ශේෂයට ගැළපීම් වශයෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුවට ද නොලැබෙන බවත් කෙසේ වෙතත් එම වටිනාකම වත්කම් වශයෙන් පෙන්විය යුතු බැවින් ආරම්භක ශේෂයට ගැලපීමට කටයුතු කරන ලද බවත් දන්වා තිබුණි.මේ සම්බන්ධයෙන් සිගාස් වැඩසටහන තුළ සටහන් තැබීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතු බවට අදාළ විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ii) **ණය සහ අත්තිකාරම් ලේඛනය** | | |
| 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතු බවට අදාළ විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය. |

**2.** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් තුනක් (03) ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.33,000,000 ක් සඳහා වර්ෂය තුළ මුදල් රෙගුලාසි 66 මඟින් එකතුව රු.24,292,000 ක් වූ ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණද ඉන් රු. 20,869,041 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 31 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | පැවැති අවශ්‍යතාවයන් අනුව අදාළ වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරු කළද පසුව මතුවූ විශේෂිත තත්ත්වයන් යටතේ අදාළ වියදම් දැරීමට අවශ්‍ය නොවූ බවත් විශේෂයෙන්ම, මතුවූ අයහපත් කාලගුණ තත්ත්වයන් හා අපොස උසස්පෙල විභාගය කල් දැමීම නිසා වසර අවසානය තෙක් දිනයක් වෙන් කර ගැනීමට නොහැකි වීම මත සමස්ත ලංකා සිසු නිපුණතා වැඩසටහන පැවැත්වීමට නොහැකි වූ බවත් දන්වා තිබුණි. | මු.රෙ.50 ප්‍රකාරව හැකිතාක් දුරට තාත්ත්විකව සහ නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 13ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.348,358,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.143,197,161ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 32 සිට සියයට 97 දක්වා පරාසයක පැවතුණි. | උක්ත (අ) යටතේ සඳහන් තත්ත්වයන් මෙන්ම, දහම් පාසල් ගුරුවරුන්ට දීමනා ගෙවීමට වෙන්ව තිබූ ප්‍රතිපාදනයෙන් එම දීමනා ගෙවන අවස්ථාව වන විට සම්පූර්ණයෙන් සුදුසුකම් ලබා තිබූ ගුරුවරුන් සේවයේ නොසිටීම නිසා එම දීමනාව නොගෙවීම හේතුවෙන් එම වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරියක් සිදු වී ඇති බව දන්වා තිබුණි. | එම |

| | | |
|---|---|---|
| (ඇ) එක් මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු. 21,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 14,988,702 ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 71 ක් විය. | මහානායක චාරිකාරාමයට අදාළ විදුලි සෝපානයක් සවිකිරීමට හා විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ද මෙම ප්‍රතිපාදන යොදවා ගැනීමට කලින් සැලසුම් කරගෙන සිටියද අදාළ ඇස්තමේන්තුවේ ද වටිනාකම් අනුව එම ප්‍රතිපාදන අදාළ කාර්යයන් සඳහා ප්‍රමාණවත් නොවීම මත අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට අවශ්‍ය වීමත් එම අවශ්‍යතාවයන් සපුරා ගැනීම අත්‍යවශ්‍යද යන්න නැවත සලකා බැලීමට තිරණය වීමත් නිසා මෙලෙස වෙන්ව තිබූ ප්‍රතිපාදන ඉතිරිවූ බව දන්වා තිබුණි. | ඇස්තමේන්තු කිරීමට පෙර අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතුය. |

## 3.2 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)වසර දෙක ඉක්මවූ, එකතුව රු.731,571 ක තැන්පතු දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) හා (3) විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි. | අදාළ කාලය ඉක්මවා පැවැති තැන්පතු සම්බන්ධයෙන් ඒවා අදාළ කාර්යන් සඳහා වහාම යොදවා ගැනීම හෝ මුදල් රෙගුලාසි 571 (2) හා (3) විධිවිධාන අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ)2024 වර්ෂයේ වෙසක් උත්සවය වෙනුවෙන් පරිත්‍යාගශීලීන් සිව් දෙනෙකු විසින් ලබා දී තිබූ පරිත්‍යාග වලින් අදාළ කාර්යයට යොදා නොගෙන ඉතිරි වූ එකතුව රු.778,000ක් වූ මුදලක් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මෙම තැන්පතු තැන්පත් කරන ලද දින සිට වසර දෙකක් රඳවා තබාගත හැකි නමුත්,අදාළ කාර්යයන් සඳහා හැකි ඉක්මනින් මෙම මුදල් යොදා ගෙන නිරවුල් කරන ලෙස අදාළ අංශ වලට උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | තැන්පතු අදාළ කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් මහානායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.මිලියන 21න් රු.මිලියන 6ක් පමණක් වැය කර තිබූ අතර ඉලක්ක ගත භෞතික ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහානායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණයට අදාළව විදුලි සෝපානයක් සවිකිරීමට හා විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මෙම ප්‍රතිපාදන යොදවා ගැනීමට කලින් සැලසුම් කරගෙන සිටියද අදාළ ඇස්තමේන්තුවේ වටිනාකම් අනුව එම ප්‍රතිපාදන අදාළ කාර්යයන් සඳහා ප්‍රමාණවත් නොවීම මත අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට අවශ්‍ය වීමත් එම අවශතාවයන් සපුරා ගැනීම අත්‍යවශ්‍යද යන්න නැවත සලකා බැලීමට තිරණය වීමත් නිසා බව දන්වා තිබුණි. | සැලසුම් කිරීමේදී අදාල වන සියලු කාරණා ගැන ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් සැලසුම් සකස් කල යුතු බව. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව බෞද්ධ පුනර්ජීවය ඇතිවන පරිදි අනුබුදු මිහිඳු නාහිමියන් සැමරීමේ උත්සවය පැවැත්වීම හා ඊට සමගාමීව දිවයින පුරා විවිධ වැඩසටහන් සංවිධානය කිරීමට සැලසුම් කර තිබුණද ඊට අදාළව කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි. | අනුබුදු මිහිඳු නාහිමි සැමරුම සඳහා අදාළ ප්‍රතිපාදන අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙත වෙන් කර දුන්නද මිහින්තලයේ රජමහා විහාරාධිපති ස්වාමීන් වහන්සේ එම අනුග්‍රහය ප්‍රතික්ෂේප කළ බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් සැලසුම් කළ පරිදි සිදු කළ යුතු වීම. |
| (ඇ) | බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණක් වුවද, ඒ වෙනුවෙන් 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රතිපාදන සීමාවන් හේතුවෙන් අත්‍යවශ්‍ය වැය විෂයයන් සඳහා පමණක් මුදල් වෙන් කර ගැනීමට ලබා දුන් උපදෙස් අනුව කටයුතු කළ බවත් 2026 වර්ෂයේ ද පසුගිය වර්ෂවල මුදල් වෙන් කළ විෂයයන්වලට හැර මුදල් වෙන් කිරීමක් සිදු නොකරන ලද බවත් දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට හැකි වන අයුරින් අදාළ සැලසුම් සකස් කර ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ගත යුතු වීම. |

## 4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී හිමිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ 2025 වර්ෂයට අදාළ දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය සඳහා රු.මිලියන 250ක් වෙන් කර ගෙන තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 170ක් පමණක් වැය කර තිබුණි. පෙළපොත් බෙදා හරිනු ලබන දිස්ත්‍රික්ක සංඛ්‍යාව 22ක් වුවද, 2024 කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී දිස්ත්‍රික්ක 9කට අදාළව දහම් පාසල් 4882කට පමණක් එම පෙළ පොත් බෙදා දීම සිදු කර තිබුණි. | 2024 වර්ෂය සඳහා රජයේ මුද්‍රණාලය වෙතින් පෙළ පොත් අවශ්‍යතාවය අනුව 1,922,000 ක් මුද්‍රණය කරන ලද බවත් 2024 වර්ෂයේ 6-10 ශ්‍රේණි විභාගය 2025 වර්ෂයේ ජනවාරි 26 වන දින පැවැත්වීමට සිදු කල අතර දහම් පාසල් මඟින් පෙළ පොත් සිසුන් වෙත බෙදා දීම සිදු කරනු ලබන්නේ ශ්‍රේණි විභාගය පැවැත්වීමෙන් පසුව බවත්, 2024 වර්ෂයේ නොවැම්බර් මස දී පවත්වන ලද මහමැතිවරණය හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ලොරි රථ ලබා ගැනීමට අපහසු වීමත් නිලධාරින් එම රාජකාරී කටයුතු වල යෙදවීම හා සැලසුම් කල පරිදි පෙළ පොත් ප්‍රවාහන කටයුතු ඇතැම් දිස්ත්‍රික්කයන් වල සිදු නොවීම හේතුවෙන් ප්‍රවාහනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතුරු වූ බවත් දන්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ පරිදි අදාළ කාර්යයන් ඉටු කළ යුතු වීම. |

## 4.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී හිමිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව 2024 වර්ෂය සඳහා වූ වත්කම් මිලදී ගැනීම හා අපහරණය පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තාව ඉදිරියේ දී නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලෙස විෂය නිලධාරීන් වෙත දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් වල තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

## 4.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ වාහනයක් සම්බන්ධයෙන් සිදුවූ අනතුරකට අදාළව රු.130,154 ක් වූ අලාභයෙන් රු.85,554ක් පමණක් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණු අතර මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව මඟින් ඉතිරි මුදල වන රු.44,620 හානිපාඩුවක් ලෙස කපා හැරීමට නිර්දේශ කර තිබුණද ,ඒ සම්බන්ධයෙන් වාර්තාව නිකුත් කරන දිනය වන විටත් මු.රෙ 108 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ 108 හා 109 ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මියගිය නිලධාරීන්ගෙන් අය විය යුතු එකතුව රු.152,680ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4:4, 4:5 සහ 4:6 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර අවුරුදු 03 ඉක්මවා තිබූ එකතුව රු.121,430ක් වූ ණය ශේෂයක් ද ඊට ඇතුළත්ව තිබුණි. | මෙම ණය ශේෂ පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4:4, 4:5 සහ 4:6 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් නම් කර ඔහුට අදාළ වගකීම් පවරා දීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහානායක වාරිකාරාම ගොඩනැඟිල්ල දෙපාර්තමේන්තුව විසින් ඉදි කර තිබුණ ද, අදාළ ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දිනය වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි. | මහානායක වාරිකාරාමයට අදාළ ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාළව අදාළ ආයතන වෙත දන්වා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | කඩිනමින් අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | කැලණිය ඊරියවැටියේ දස සිල් මාතා මූලස්ථානය ඉදි කරන ලද ඉඩම, 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමින් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දැනුම් දී වර්ෂ 12 කට වැඩි කාලයක් ගත වුව ද මෙතෙක් ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කර ගෙන නොතිබුණි. | කැලණිය ඊරියවැටිය දස සිල් මාතා ආයතනට අදාළ ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාළව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | කඩිනමින් අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | දෙපාර්තමේන්තුව විසින් 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ ඇති පහත නියමයන් අනුගමනය කර නොතිබුණි. | | |
| **i.** | 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 3 වගන්තිය පරිදි බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ පවතින සියළුම සිද්ධස්ථාන සංඛ්‍යාව හා පනතේ විධිවිධානයන්ගෙන් නිදහස් කර ඇති සිද්ධස්ථාන කොපමණද යන්න හඳුනා ගෙන නොතිබුණු අතර පනත යටතට ගැනෙන හා නිදහස් කරන සිද්ධස්ථාන හඳුනා ගැනීමට නිර්ණායක හඳුන්වා දීමට ද කටයුතු කර නොතිබුණි. | 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) යටතේ නිදහස් නොකරන ලද සිද්ධස්ථාන 254 ක් වන අතර අනෙකුත් සියළුම සිද්ධස්ථාන නිදහස් සේ සළකා කටයුතු කරනු ලැබේ.මෙම සිද්ධස්ථාන 254 ට අදාළ ගැසට් පත්‍ර වලින් 105ක් මේ වන විට කාර්යාලය සතුව පවතින අතර ඉතිරි ඒවාද ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ආඥා පනතේ නියමයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **ii.** | පනතේ 36(1) වගන්තිය අනුව එක් එක් වර්ෂයේ ජූනි 30 දින හා දෙසැම්බර් 31 දින අවසාන වන ඒ ඒ හය මාසය සම්බන්ධයෙන් පිළියෙළ කරනු ලබන ගණන් සටහන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂා කළ යුතු වුවද 2024 වර්ෂයේදී ලබා ගත යුතු 216 ක් වූ විහාරස්ථානවල පළමු අර්ධ වාර්ෂික ගිණුම් වාර්තා 51 ක් සහ දෙවන අර්ධ වාර්ෂික වාර්තා 59 ක් ලබාගෙන නොතිබූ අතර දේවාලවලට අදාළව ලබා ගත යුතු 38 ක් වූ දෙවන අර්ධ වාර්ෂික වාර්තා 01 ක් ලබා ගෙන නොතිබුණි. | 2024 වර්ෂයට අදාලව එක් දේවාලයකට අදාළ අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොමැති අතර එම වාර්තාවද නොපමාව ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. විහාරස්ථාන බොහොමයක විහාරාධිපති ස්වාමීන්වහන්සේ හෝ වෙනත් ස්වාමීන්වහන්සේ කෙනෙකු භාරකරු ලෙස පත් කර ඇති බැවින් අර්ධ වාර්ෂික වාර්තා ලබා ගැනීමේ දුර්වලතාවයක් පවතී. මේ සම්බන්ධයෙන් සිද්ධස්ථානයකට බස්නායක නිලමේවරයෙක් හෝ භාරකරුවෙක් පත්කරන අවස්ථාවේ ලබාදෙන රාජකාරි ලැයිස්තුව මගින් පනතේ ප්‍රතිපාදන අවධාරණය කරනු ලබන බව ද දන්වා තිබුණි. | ආඥා පනතේ නියමයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **iii.** | සිය පාලනයට යටත් කර ඇති සිද්ධස්ථාන සංඛ්‍යාව 254 ක් බැව් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් තහවුරු කර තිබූ අතර එම සිද්ධස්ථාන 254 අතුරින් 2023 සහ 2024 වර්ෂවලදී පිළිවෙලින් සිද්ධස්ථාන 16 ක් හා 06 ක් පමණක් විගණනයට ලක් කර තිබුණු බව විගණනයට වාර්තා කර තිබුණි. එය දක්වා ඇති සිද්ධස්ථාන සංඛ්‍යාවෙන් සියයට 6ක් සහ සියයට 2 ක් වශයෙන් වූ ප්‍රමාණයක් පමණක් වීම හේතුවෙන් පනතේ 38(1) වගන්තිය යටතේ වූ කාර්යභාරය ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | සොරගුණේ කතරගම දේවාලයේ විගණන වාර්තාවක් නිකුත් වීමත් සමඟ විගණන නිලධාරීන්ට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී විගණන සහයක නිලධාරීන් ස්ථාන මාරු කර ඇති අතර 2024 ජූලි මස සිට දෙසැම්බර් දක්වා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී තිබුනු බැවින් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ සිදු කරන ලද රත්නපුර සමන් දේවාලය හා සංඛපාල රජමහා විහාරයේ විගණන වාර්තාවල පිටපත් ලබා දී නොමැති බව දන්වා තිබුණි. 2024 ජූලි මාසයේදී ප්‍රධාන අභ්‍යන්තර විගණක උසස්වීම් ලැබ ස්ථාන මාරු වී ගිය අතර ඔහු වෙනුවට වෙනත් නිලධාරියකු 2025 ජනවාරි 01 දින සිට පැමිණ ඇති අතර පසුගිය කාලයේදී ඔහු නාවික | ආඥා පනතේ නියමයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | හමුදාවේද වැඩ බලන ලදී. මෙවැනි හේතු නිසා සිද්ධස්ථාන විගණන කටයුතු අඩු වී ඇති බවත් දන්වා තිබුණි. | |
| **iv.** | පනතේ 38(2) වගන්තිය අනුව පරීක්ෂණය සිදු කරන නිලධාරියා එබඳු පරීක්ෂණයක් අවසානයේදී වාර්තාවක් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත යැවිය යුතු වුවත් පනතේ එම කොන්දේසිය ඉටුකර තිබේද යන්න පරීක්ෂා කිරීමට අදාල විගණිත වාර්තා හා එම වාර්තාවල ඇතුලත් කරුණු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද, පනතේ 38(1) හා 38(2) වගන්ති අනුව සිද්ධස්ථාන භාරකාරයින්ගේ සියලු ගණන් පරීක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | 1931 අංක 19 දරන විහාර දේවාලගම් පනතේ ප්‍රතිපාදන මේ සම්බන්ධයෙන් නොමැති බැවින් විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැති බවත් විගණනය කරන ලද සිද්ධස්ථාන තොරතුරු ඉදිරිපත් කර ඇති බවත් විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව සිද්ධස්ථාන 254ක විගණන කටයුතු සිදුකල යුතු වුවද අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව සේවයේ නියුතු නිලධාරීන් ප්‍රමාණය මත සිදුකල හැකි උපරිම ධාරිතාවයෙන් විගණන කාර්යන් සිදුකර ඇති බවත් දක්වා තිබුණි. | ආඥා පනතේ නියමයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **v.** | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණුවල දක්වා ඇති කාර්යයන් හා 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපල සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම හා ශාසනික නියාමන කටයුතු සිදු කිරීම යන කර්තව්‍යයන් ඉෂ්ට කිරීම සඳහා ප්‍රමාණවත් පරිපාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා යොදා ඇති අවධානය ප්‍රමාණවත් නොවීය. | 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානවල දේපල පරිපාලනය සඳහා ප්‍රමාණවත් කටයුතු අනුගමනය කර අනුමාන අයවැය සහ අර්ධ වාර්ෂික වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බවත් විහාරස්ථාන වලින් ඒවා ඉදිරිපත් කිරීමේ අපහසුතා පවතින අතර එම තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇති අතර ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කර එම කටයුතු අධීක්ෂණය කර ඇත.විහාර දේවාලගම් ආඥා පනත ප්‍රකාරව අනුමාන අයවැය හා අර්ධ වාර්ෂික වාර්තා ලබා ගැනීමට අදාල සිද්ධස්ථාන 254 වන අතර ඒ අතරින් දේවාලවලට විශේෂ අවධානය යොමු කර ඇති බවත් දන්වා | ආඥා පනතේ නියමයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | තිබුණි.මීට අමතරව අනෙකුත් සියළු සිද්ධස්ථානවල පරිපාලන කටයුතු පවතින අතර එම ප්‍රමාණය දෛනිකව බලනවිට ඉතා විශාල ප්‍රමාණයක් බවත් කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පවතින බවත් දන්වා තිබුණි. | |
| (ඊ) | දෙපාර්තමේන්තුව සඳහා සර්වර් (server) පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය පියවර නොගැනීම හේතුවෙන් දෙපාර්තමේන්තු තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය 2023 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පවතින අතර දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය ද යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අදාල සියළුම කාර්යයන් සිදු කිරීමේ දී මෘදුකාංග මඟින් සිදු කිරීමට අදාලව System මේ වන විට සකස් කරමින් පවතින බවත් ඒ සඳහා අවශ්‍ය Tanent පහසුකම ද LGC වෙතින් ඉල්ලා ඇති බවත් වෙබ් අඩවිය ඇතුළු දත්ත පද්ධති සියල්ල 2025 වර්ෂ අවසානයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරෙමින් පවතින බවත් දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සඳහා සර්වර් (server) පහසුකම් ලබා ගැනීමට හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු වීම. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් 2024 වර්ෂය සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තා සැකසීමට විශාල තොරතුරු ප්‍රමාණයක් රැස් කර ගත යුතු වන බැවින් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇති අතර හැකි ඉක්මනින් එය ඉදිරිපත් කර එහි පිටපතක් එවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |